DISTRICT SECRETARIAT, JAFFNA



2022

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ඇමතිතුමා හෝ අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்ட நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Submission of observations of Hon.Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of standing order No.119(4)

ස්ථාවර නියෝගය. 119(4) යටතේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර.

පාර්ලිමේන්තු මාලා අංක - 79
ආයතනයේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය

අනු අං	ගිණුම් පිළිබඳ කමිටුව මගින් හඳුනාගත් අඩුපාඩු	හඳුනාගත් අඩුපාඩු විසඳීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
01	2024.05.11 දිනැති 171/2024 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව, මෘදුකාංග පද්ධතියේ පළමු, දෙවන සහ තෙවන මුරපද මාස 3කට වරක් වෙනස් කර නොතිබුණි.	මෘදුකාංග පැකේජයේ මුරපද මාස 3කට වරක් වෙනස් කිරීමට පියවර ගෙන ඇත.
02	සියලුම සංචිතවාහන සඳහා රජයේ ලාංඡනයට තීන්ත ගානකර නැත	දැන්, සියලුම සංචිත වාහන සඳහා රාජකීය ලාංඡනයට තීන්ත ගාන කිරීමට කටයුතු කර ඇත.
03	සංවර්ධන නිලධාරීන් ලෙස අනුයුක්ත කර ඇති අය හැර, අනුමත කර ඇති කාර්ය මණ්ඩලයට අමතරව නිලධාරීන් අනුයුක්ත කර ඇත.	**නිලධාරීන්ගේ වර්ගය** / **අතිරික්තය** 1 ජ්‍යෙෂ්ඨ මට්ටම - 2 තෘතීය මට්ටම 02 3 ද්විතියික මට්ටම - 4 ප්‍රාථමික මට්ටම 04 **එකතුව** **06** **තෘතීය මට්ටම- 02** ICTO – ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මේ සඳහා වන කාර්ය මණ්ඩලය නැහැ. කෙසේ වෙතත්. මෙය නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. **ප්‍රාථමික මට්ටම - 04** අනුමත කරන ලද කාර්ය මණ්ඩල වගුවේ කාර්යාල කාර්ය සේවකු ලෙස අමාත්‍යාංශයෙන් අවසර ලබා දෙන ලදී. නමුත් අද වනතුරු පත්වීම් ලිපිය නිකුත් කරන්නේ නැත.

04	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම මාසිකව පවත්වීමට කටයුතු කරනු නොලැබේ.	2022 වර්ෂයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති පත් කර නොමැති නිසා රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොහැකි වී ඇත.
05	1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතට අනුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් පවත්වීමට කටයුතු කරන නොලදි.	සමහර රැස්වීම් අප විසින් පවත්වන ලදී. එහෙත්, 2022 වර්ෂයේ රැස්වීම්, රටේ ඇතිවී ඇති මූල්‍යමය ගැටළු හේතුවෙන් මෙම ආඥා පනතට අනුව පැවැත්වුණේ නැත. කෙසේ වෙතත් ඉදිරියේදී මෙම රැස්වීම් පැවැත්වීමට පියවර ගෙන ඇත.
06	දිස්ත්‍රික් නිවාස කමිටු රැස්වීම මාසිකව පවත්වීමට කටයුතු කරන නොලදි.	එම රැස්වීම් පැවැත්වුණු අතර, ඒ සඳහා වන වාර්තා ලේඛනගත කිරීමට අපට නොහැකි විය. කෙසේ වෙතත්, ඉදිරියේදී මාසික රැස්වීම් අදාල පරිදි පවත්වා එය ලේඛනගත කිරීමට පියවර ගෙන ඇත.
07	දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව පවත්වීමට කටයුතු කරන නොලදි.	මාසික පදනමින් එවැනි රැස්වීම් පැවැත්වීම සඳහා අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ අද දක්වා පත් කර නොමැත. කෙසේ වෙතත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කැඳවා ඇති රැස්වීම්වලදී පොහොර සම්බන්ධ කරුණු සාකච්ඡා කරන ලදී.
08	දිස්ත්‍රික් මිල නියම කිරීමේ රැස්වීම් මාසිකව පවත්වීමට කටයුතු කරන නොලදි.	සමහර රැස්වීම් අප විසින් පවත්වන ලදී. කෙසේ වෙතත්, මිල ගණන්වල අඛණ්ඩව වෙනස්කම් නොමැති බැවින් තවදුරටත් රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාවයක් නොතිබීම.
9	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය, යටත්ව මතය (සුදුසු), පැහැදිලි මතය / ව්‍යාචනය /අභිතකර මතය .	විගණකාධිපතිවරයා පෙන්වා දුන් බොහෝ කරුණු ප්‍රතිශෝධනය කර ඇති අතර අනෙක් මතය නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.
10	විගණකාධිපතිවරයා නිකුත් කළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද නිර්දේශ බොහොමයක් ක්‍රියාත්මක කර ඇති අතර අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

11	සියලුම රාජ්‍ය නිලධාරීන් තමන්ගේ වත්කම් හා බැරකම් පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.	බොහෝ නිලධාරීන්ගෙන් වත්කම් බැරකම් සම්බන්ධ තොරතුරු එක්රැස් කර ඇති අතර අනෙකුත් සියලුම නිලධාරීන්ගෙන් තොරතුරු රැස් කිරීමට පියවර ගෙන ඇත.
12	උපරිම සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන්ට නිසි ස්ථාන මාරුවක් ලබාදීමට පියවර ගෙන නොමැත.	දැන්, උපරිම සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන්ට ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී.
13	දිස්ත්‍රික් පරිසර කමිටු රැස්වීම මාස දෙකකට වරක් කැඳවීමට කටයුතු කරනු නොලැබේ.	අනාගතයේ දී, මෙම රැස්වීම මාස දෙකකට වරක් අදාල පරිදි කැඳවීමට පියවර ගෙන ඇත.

එන්. එස්. ආර්. සිවරූබන්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
යාපනය

N.S.R. Sivaruban
Chief Accountant,
For Government Agent / District Secretary,
District Secretariat,
Jaffna.

එම්. පිරතීබන්
දිස්ත්‍රික් ලේකම් / දිසාපති, (වැ.බ)
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
යාපනය

M.Piiratheepan
Government Agent/ District Secretary (Actg.)
Jaffna District

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
''නිල මැදුර'' ඇල්විටිගල මාවත, කොළඹ 05.

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍ය සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.